කැලණිය විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව
විද්‍යා පීඨය
කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය
විශ්වවිද්‍යාල ප්‍රවේශය 2018/2019

## යෝග්‍යතා පරීක්ෂණය

### කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව (MIT) කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය මගින් ආරම්භ කර, මේ වන විට ව්‍යාපාර සහ මෘදුකාංග ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉතා ඉහළ පිළිගැනීමක් හිමි කරගනිමින් ඉතා සාර්ථකව පවත්වාගෙන යන උපාධි පාඨමාලාවකි. මෙම පාඨමාලාව හැදෑරීම මගින් තොරතුරු තාක්ෂණය **(Information Technology),** තොරතුරු පද්ධති **(Information Systems),** ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව **(Business Systems Engineering)** සහ මෙහෙයුම් හා සැපයුම් ජාල කළමනාකරණය **(Operations & Supply Chain Management)** යන විෂය ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයක් තෝරාගෙන ප්‍රගුණ කිරීමට අවස්ථාව සැලසේ.

කළමනාකරණය පිළිබඳ දැනුම සහ තොරතුරු තාක්ෂණ නිපුණතාව සහිත වෘත්තිකයනට ඇති ඉහළ ඉල්ලුම සැලකිල්ලට ගෙන ශ්‍රී ලාංකික සිසුනට නවීනතම අධ්‍යාපනයක් ලබාදීම සඳහා පර්යේෂණ, ව්‍යාපෘති සහ සය මසක සීමාවාසික පුහුණුව ද සහිතව මෙම පාඨමාලාව සකස් කර ඇත.

අපගේ දැක්ම හා එක්වීමට ඔබත් කැමතිනම් අපගේ අභියෝගතා පරීක්ෂණය සඳහා **www.mit.kln.ac.lk** ඔස්සේ අයදුම් කල හැකිය. මෙහිදී පහත සඳහන් ලියකියවිලි නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම අවශ්‍යවේ. (අන්තර්ජාලය ඔස්සේ අයදුම්කරන ලද අයදුම්කරුවන්, සෑම ලේඛනයකම දකුණුපස ඉහළ කෙළවරේ අන්තර්ජාලය ඔස්සේ අයදුම් කිරීමේදී ලැබෙන යොමු අංකය සඳහන් කළ යුතු ය.)

**අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන ලියකියවිලි අමුණා එවිය යුතුය.**

1. මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින්, ගිණුම් අංක 055-1001-30667553 මහජන බැංකුව, කැලණිය ශාඛාවට රුපියල් පන්සියක් (රු.500/-) බැර කරන ලද ලදුපත.

2019.02.03 දින **Sunday Observer** ප්‍රවෘත්ති පත්‍රයේ පළවන ආකෘතියට අනුව සකස් කල අයදුම්පතක් පුරවා ඉහත ලියකියවිලි ද සමග ලියාපදිංචි තැපැල මගින් ද අයදුම් කල හැකිය. අයදුම්පත් **www.mit.kln.ac.lk** වෙබ් අඩවියෙන් ද බාගත හැකිය. විමසීම්:- 011-2914482

**මෙම පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබීම අනිවාර්ය වේ.**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සඳහන් සුදුසුකම් සපුරා තිබීම.
11. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කරන අයදුම්පතෙහි කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී පාඨමාලාවට ඉහළ ප්‍රමුඛතාවයක් ප්‍රකාශ කර තිබීම.
111. කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම.

**යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.**

අ.පො.ස. (උසස් පෙළ) 2018 විභාගයේදී උසස් ගණිතය, සංයුක්ත ගණිතය, ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් සහිතව,

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයට ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් ඉදිරිපත්ව විෂයයන් තුනම සමත් වීම.

**හෝ**

11. ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් දෙකක් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයය සමත් වීම.

තැපැල් අයදුම්කරුවෝ A4 ප්‍රමාණයට සැකසූ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය යන ලිපිනයට 2019 මාර්තු 01 වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතු අතර අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරෙහි "කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව" යනුවෙන් සඳහන් කළ යුතුය.

**යෝග්‍යතා පරීක්ෂණය 2019 අප්‍රේල් 27 වන සෙනසුරාදා දින පැවැත්වෙන අතර මාධ්‍යය ඉංග්‍රීසි මාධ්‍යය වේ. නිසිලෙස සම්පූර්ණ නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.**

ලේඛකාධිකාරී,
කැලණිය විශ්වවිද්‍යාලය කැලණිය.

කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව